# ජේතවනාරාම පිළිමගෙය හා මඤ්ජුශ්‍රීභාෂිතවාස්තුවිද්‍යාශාස්ත්‍රාගත ප්‍රතිමාගෘහ සිද්ධාන්ත


පනාවල ධම්මධජ හිමි

*සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*

*dhammadhajas@gmail.com*



මහසෙන් රජතුමා විසින් සිය පාලන සමයේදී ඉදිකරන ලද ජේතවනාරාමය අසල විශාල ප්‍රතිමාගෘහයක නටබුන්ද සොයාගෙන තිබේ. මඤ්ජුශ්‍රීභාෂිතවාස්තුවිද්‍යාශාස්ත්‍රය නැමැති සංස්කෘත වාස්තු සිද්ධාන්ත සංග්‍රහයෙහි ප්‍රතිමාගෘහය මෙන්ම ආරාම සංකීර්ණයක බොහෝ අංග පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙම පර්යේෂණයෙහි ගැටලුව වන්නේ ජේතවනාරාම පිළිමගෙය නිර්මාණයේදී එකී මඤ්ජුශ්‍රීභාෂිතවාස්තුවිද්‍යාශාස්ත්‍රාගත සිද්ධාන්ත හෝ වෙනත් සංස්කෘත මූලාශ්‍රයාගත සිද්ධාන්ත හෝ වාස්තු සම්ප්‍රදායයක් හෝ බලපා තිබේද යන්නයි. මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මඤ්ජුශ්‍රීභාෂිතවාස්තුවිද්‍යාශාස්ත්‍රය, බිම්බමානය ප්‍රධාන මූලාශ්‍රය ලෙස පුරාවිද්‍යා කැණීම් හා සංරක්ෂණ වාර්තා අධ්‍යයනයත් පුස්තකාල පරිහරණයත් ක්ෂේත්‍ර අධ්‍යයනයත් තුළින් දත්ත සංග්‍රහ කරගැනිණි. මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයෙන් ලක්දිව ප්‍රතිමාගෘහ ඉදිකිරීමේදී සංස්කෘත වාස්තුවිද්‍යා මූලාශ්‍රය සිද්ධාන්ත උපයෝගි වී ඇති බව සනාථ වේ. නූතන ප්‍රතිමාගෘහ නිර්මාණයේදී උපයුක්ත කරගත යුතු නිවැරදි වාස්තු දැනුමත් ක්‍රමවේදයත් සමාජගත කිරීම මෙම පර්යේෂණයෙහි ප්‍රමුඛ පරමාර්ථය වේ.



**ප්‍රමුඛ පද:** බිම්බමානය, ප්‍රතිමාගෘහය, ජේතවනාරාමය, මඤ්ජු ශ්‍රී භාෂිතවාස්තුවිද්‍යාශාස්ත්‍රය, වාස්තුවිද්‍යා